# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2311/18 - 2022 දෙසැම්බර් මස 21 වැනි බදාදා - 2022.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2022 අංක 25 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි 2022 දෙසැම්බර් මස 21 වන දින සිට බලාත්මක වේ.

3. 2022 ඔක්තොම්බර් මස 05 දිනැති අංක 2300/12 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 17 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මගින් සංශෝධිත 2012 ජනවාරි මස 02 දිනැති අංක 1739/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3.1 ඉහතින් සඳහන් කරන ලද 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් රෙගුලාසිවල **IV** වන උපලේඛනයට පහත විස්තර කර ඇති භාණ්ඩ සහ ඒවායේ අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| *අංකය* | *කාණ්ඩය* | ***HS** සංකේතය* |
|---|---|---|
| **23** | ග්ලයිෆොසේට් | 2931.39.10 |
| **24** | ග්ලයිෆොසේට් | 3808.93.20 |

4. කලින් කල සංශෝධිත, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

4.1 2022 දෙසැම්බර් 21 සිට 2023 ජූනි 21 දක්වා කාලය තුළ, **සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ශීර්ෂ 31.02, 31.03, 31.04, සහ 31.05** යටතේ වර්ගීකරණය කර ඇති පහත සඳහන් භාණ්ඩ, එවැනි භාණ්ඩ ශ්‍රී ලංකාවේ වරාය / ගුවන්තොටුපළ වෙත පැමිණීමට පෙර කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලබාගන්නා ලද නිර්දේශයට යටත්ව විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රමයටතේ ආනයනය කිරීම සඳහා අවසර ලබාදෙනු ලැබේ.

| | *I තීරුව* **සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය** | *II තීරුව* **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III තීරුව විස්තරය* | *IV තීරුව* **විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම සඳහා අවසර ඇත (OAP)** |
|---|---|---|---|---|---|
| **01** | **31.02** | | | **නයිට්‍රජනීය ඛණිජමය හෝ රසායනික පොහොර.** | |
| | | 3102.10.00 | - | ජලීය සංයෝගයකින් යුක්ත වූ හෝ නොවූ යූරියා | OAP |
| | | | - | ඇමෝනියම් සල්පේට් ඇමෝනියම් නයිට්රේට් වල හා ඇමෝනියම් සල්පේට් වල සම්මිශ්‍රණ සහ ද්විත්ව ලවණ : | |
| | | 3102.21.00 | -- | ඇමෝනියම් සල්පේට් | OAP |
| | | 3102.29.00 | -- | අනෙක`ත් | OAP |
| | | 3102.30.00 | - | ජලීය සංයෝගයකින් යුක්ත වූ හෝ නොවූ ඇමෝනියම් නයිට්රේට් | OAP |
| | | 3102.40.00 | - | කැල්සියම් කාර්බනේට් හෝ අනිකුත් අකාබනික පොහොර නොවන ද්‍රව්‍යයන් සමග මිශ්‍ර වූ ඇමෝනියම් නයිට්රේට් | OAP |

| | *I තීරුව* **සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය** | *II තීරුව* **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III තීරුව* *විස්තරය* | *IV තීරුව* **විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම සඳහා අවසර ඇත (OAP)** |
|---|---|---|---|---|---|
| | | 3102.50.00 | - | සෝඩියම් නයිට්‍රේට් | OAP |
| | | 3102.60.00 | - | ද්විත්ව ලවණ සහ කැල්සියම් නයිට්‍රේට් හා ඇමෝනියම් නයිට්‍රේට් වල සම්මිශ්‍රණ | OAP |
| | | 3102.80.00 | - | ජලීය හෝ ඇමෝනියාමය ද්‍රාවණයක යෙදූ යූරියා හා ඇමෝනියම් නයිට්‍රේට් වල සම්මිශ්‍රණ | OAP |
| | | 3102.90.00 | - | මෙහි ඉහත දැක්වෙන උප ශීර්ෂවල නිශ්චිත ලෙස සඳහන් කොට නොමැති සම්මිශ්‍රණ ඇතුළුව අනෙකුත් | OAP |
| | | | | | |
| **02** | **31.03** | | | **පොස්පැටික ඛණිජමය හෝ රසායනික පොහොර.** | |
| | | | - | සුපර් පොස්ෆේට් | |
| | | 3103.11.00 | - | 35%හෝ ඊට වැඩි ප්‍රමාණයක බරකින් යුත් ඩයිෆොස්පරස් පෙන්ටොක්සයිඩ් (පි$_2$ඕ$_5$) අන්තර්ගත | OAP |
| | | 3103.19.00 | -- | අනෙකුත් | OAP |
| | | 3103.90.00 | - | අනෙකුත් | OAP |
| | | | | | |
| **03** | **31.04** | | | **පොටෑසික ඛණිජමය හෝ රසායනික පොහොර.** | |
| | | 3104.20.00 | - | පොටෑසියම් ක්ලෝරයිඩ් | OAP |
| | | 3104.30.00 | - | පොටෑසියම් සල්ෆේට් | OAP |
| | | 3104.90.00 | - | අනෙකුත් | OAP |
| | | | | | |

| | I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම සඳහා අවසර ඇත (OAP) |
|---|---|---|---|---|---|
| **04** | **31.05** | | | **නයිට්‍රජන් පොස්පරස් සහ පොටෑසියම් යන මූල ද්‍රව්‍යයන්ගෙන් දෙවර්ගයක් හෝ තුන් වර්ගයක් අඩංගු වූ ඛණිජමය හෝ රසායනික පොහොර වර්ග අනිකුත් පොහොර වර්ග පෙති ආකාරයෙන් හෝ ඒ හා සමාන ස්වරූප ඇත්තාවූ හෝ මුළු බර කි.ග්‍රෑ.10 කට නොවැඩි ඇසුරුම්වල බහාලු මෙම පරිච්ඡේදයට අයත් භාණ්ඩයන්.** | |
| | | 3105.10.00 | - | පෙති හෝ ඒ හා සමාන ස්වරූප ඇත්තා වූ හෝ මුළු බර කි.ග්‍රෑ.10ට නොවැඩි ඇසුරුම්වල බහාලු මෙම පරිච්ඡේදයට අයත් භාණ්ඩයන් | OAP |
| | | 3105.20.00 | - | නයිට්රජන් පොස්ෆරස් සහ පොටෑසියම් යන මූල ද්‍රව්‍යයන් තුනක් අඩංගු වූ ඛණිජමය හෝ රසායනික පොහොර | OAP |
| | | 3105.30.00 | - | ඩයිඇමෝනියම් හයිඩ්‍රජන් ඕතොෆොස්ෆේට් (ඩයිඇමෝනියම්පොස්ෆේට්) | OAP |
| | | 3105.40.00 | - | ඇමෝනියම් ඩයිහයිඩ්‍රජන් ඕතොපොස්ෆේට් (මොනෝ ඇමෝනියම්පොස්ෆේට්) සහ ඩයි ඇමෝනියම් හයිඩ්‍රජන් ඕතොපොස්ෆේට් (ඩයිඇමෝනියම්පොස්ෆේට්) සමග වූ ඒවායේ සම්මිශ්‍රණ | OAP |
| | | | - | නයිට්‍රජන් සහ පොස්පරස් යන මූල ද්‍රව්‍යන් දෙක අඩංගු වූ අනිකුත් ඛණිජමය හෝ රසායනික පොහොර : | |
| | | 3105.51.00 | -- | නයිට්‍රේට් සහ පොස්ෆේට් අන්තර්ගත | OAP |
| | | 3105.59.00 | -- | අනෙකුත් | OAP |
| | | 3105.60.00 | - | ෆොස්ෆරස් සහ පොටෑසියම් යන මූල ද්‍රව්‍යයන් දෙක අඩංගු වන්නා වූ ඛණිජමය හෝ රසායනික පොහොර | OAP |
| | | 3105.90.00 | - | අනෙකුත් | OAP |

**4.2** කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍යවන බඩ **ඉරිඟු (එච්. එස්. 1005.90.00)** විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ;

**i** 2022 සැප්තැම්බර් මස 16 දිනැති අංක 2297/79 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 15 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි වල අංක 5 රෙගුලාසි යෙන් අවසර දී ඇති පරිදි එම භාණ්ඩ ශ්‍රී ලංකාවේ වරායට / ගුවන්තොටුපළට පැමිණීමට පෙර ලබාගන්නා ලද කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය මත, ලියාපදිංචි කුකුළු ආහාර නිෂ්පාදකයින් විසින් ආනයනය කිරීම, 2023 ජනවාරි 15 දක්වා දීර්ඝ කෙරේ.

**ii** ඉහත රෙගුලාසි අංක 4.2 (i) හි සඳහන් කර ඇති අය හැර වෙනත් ඕනෑමආනයනකරුවෙකු විසින්, 2022 දෙසැම්බර් 21 සිට 2023 ජනවාරි 15 දක්වා කාලය තුළ, එම භාණ්ඩ ශ්‍රී ලංකාවේ වරාය / ගුවන්තොටුපළට පැමිණීමට පෙර ලබාගන්නා ලද කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ආනයනය කිරීම සඳහා මෙයින් අවසර ලබාදෙනු ලැබේ.

4.3 ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත අංක 4.2 (i)සහ (ii) රෙගුලාසීන් උල්ලංඝනය කරමින් සිදුකරන ඕනෑම ආනයනයක් සම්බන්ධයෙන් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් සහ ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාගෙන් උපදෙස් ලබා ගත යුතුය.

5. මෙම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ශ්‍රී ලංකා රේගුව සහ බලපත්‍රලාභී බැංකු වෙත අවශ්‍ය "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබේ.

EOG 12 - 0350

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.